# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**8 ශ්‍රේණිය** | **ඉතිහාසය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2යි

### I කොටස

★ **01 සිට 05 තෙක් ප්‍රශ්නවල වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) මහාවංශයේ සඳහන් වන පරිදි පණ්ඩුකාභය රජතුමා විසින් ඉදිකළ ප්‍රථම වැව ලෙස සැළකෙන්නේ
1) තිසා වැවයි
2) අභය වැවයි
3) ගාමිණී වැවයි
4) මින්නේරි වැවයි

02) "ජය ගඟ" හෙවත් යෝධ ඇළ තැනීමේ ප්‍රධාන කාර්යය වන්නේ
1) මහවැලි ගඟේ ජලය රැගෙන යාමයි
2) වැව් පද්ධතියකට ජලය ගෙන යාමයි
3) වගා බිම්කරා ජලය ගෙන යාමයි
4) කලා වැවේ සිට තිසා වැව කරා ජලය ගෙන යාමයි

03) පොළොන්නරු යුගයේ අලංකාරය සඳහා ඉදිකළ පොකුණු වලට නිදසුනක් වන්නේ
1) රන්මසු උයනේ පොකුණු ය
2) අභයගිරියේ ඇත් පොකුණ ය
3) කුට්ටම් පොකුණ ය
4) නෙළුම් පොකුණ ය

04) අතීතයේ මෙරට යකඩ නිෂ්පාදනය පැවති බවට පැහැදිලි සාධක හඳුනා ගත හැකි ප්‍රදේශය වන්නේ
1) සීගිරියේ අලකොළ වැවයි
2) මහවිලච්චිය ප්‍රදේශයයි
3) අනුරාධපුර නගර ප්‍රදේශයයි
4) මන්නාරම් ප්‍රදේශයයි

05) සාහිත්‍ය මූලාශ්‍ර අනුව ශ්‍රී ලංකාවේ ඉදිකළ මුල්ම දගැබ ලෙස සැළකෙන්නේ
1) මිරිසවැටිය යි
2) ජේතවනය යි
3) ථූපාරාමය යි
4) අභයගිරිය යි

★ **06 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා වඩාත්ම ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

**(බෙලෙක් වැඩ/ රන් වැඩ/ වටදාගෙය/ වළගම්බා රජු මහසෙන් රජු/ තොලුවිල/ සීගිරි/ දඹුලු විහාර)**

06) ප්‍රමාණයෙන් කුඩා දගැබ් ආවරණය සඳහා තැනූ ගෘහය .................................... ලෙස හැඳින්වේ.

07) අභයගිරි ස්ථූපය තැනවූයේ ............................................... රජතුමාය.

08) ගන්ධකුටි සම්ප්‍රදයට තැනූ පිළිමගෙයක් ලෙස ................................ පිළිමගෙය හඳුනාගත හැකිය.

09) මුල් කාලයේ ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව හඳුනාගත හැක්කේ .................................. ලෙන්වලය.

10) පැරණි කාලයේ "තොපෂ" ලෙස හැඳින්වීමට යොදාගෙන ඇත්තේ ............................... කර්මාන්ත ශිල්පියාය.

★ **11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර යා කරන්න.**

11) මහනුවර රාජධානිය ආක්‍රමණය කළ සීතාවක රාජධානියේ පාලකයා වන්නේ

12) පළමුවන විමලධර්මසූරිය රජු හැඳින්වූ නාමය

13) මහනුවර රාජධානියේ රජ වූ ප්‍රථම නායක්කර් වංශික පාලකයා වන්නේ

14) ලංකා ඉතිහාසයේ අවසන් සිංහල පාලකයා වූයේ

15) බුදුදහම නගා සිටුවීමට දැඩි පරිශ්‍රමයක් දැරූ නායක්කර් වංශික උඩරට පාලකයා

- ශ්‍රී විජය රාජසිංහ යි
- කීර්ති ශ්‍රී රාජසිංහ රජුය
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය
- පළමුවන රාජසිංහ රජුය
- කොනප්පු බණ්ඩාරය

★ **16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු පිළිතුර තෝරා වරහන් තුළ ලියන්න.**

16) යුරෝපයේ පුනරුදය සමඟ බිහිවූ මානවවාදී ගත්කතුවරයෙකු ලෙස හඳුනාගත හැකිය.
………………………………..

17) මෝනාලිසා චිත්‍රය නිර්මාණය කරන ලද ශිල්පියාගේ නම කුමක්ද? ……………………………………

18) දුරේක්ෂය සොයා ගන්නා ලද විද්‍යාඥයා කවර නමකින් හැඳින්වේද? ……………………………..

19) පුනරුද සමයේ රුධිර සංසරණ පද්ධතිය සොයා ගන්නා ලද්දේ කවරක්ද?
…………………………………

20) ගුරුත්වාකර්ෂණ බලය සොයා ගන්නා ලද පුද්ගලයා සඳහන් කරන්න. …………………………..

**(ගැලීලියෝ ගැලිලි/ අයිසෙක් නිව්ටන්/ තෝමස් මුවර්/ ලියනාඩෝ ඩාවින්චි/ විලියම් හාවේ)**

## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01)පහත සඳහන් වන රූප සටහන් අධ්‍යයනය කොට පිළිතුරු සපයන්න.

(අ)



i. ඉහත රූප සටහනේ දැක්වෙන්නේ කුමක්ද?

ii. එය ඉදිකරන ලද්දේ කුමන රජතුමාද?

iii. මෙම ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ කුමන නගරයක ද?

iv. මෙම ගොඩනැගිල්ලේ සැලසුමට සමාන ගොඩනැගිල්ලක නටබුන් දැකිය හැක්කේ කුමන නගරයකද?

(ල 8)

(ආ)



i. මෙම රූප සටහනේ දක්නට ලැබෙන රජතුමාගේ නාමය කුමක්ද?

ii. ඔහු රජකම් කරන ලද්දේ කුමන රාජධානියකද?

iii. මෙම රජතුමා විසින් පන්නා දැමූ විදේශීය ජාතිය නම් කරන්න.

iv. මෙතුමා ළමා කාලයේ හැඳින්වූ නම කවරක්ද?

(ල 8)

02)

i. වැවක ප්‍රධාන අංග තුනක් සඳහන් කරන්න. (ල 3)

ii. පහත සඳහන් වන වැව් නිර්මාණය කරන ලද රජවරු නම් කරන්න. (ල 3)

a) මින්නේරිය වැව

b) මහවිලච්චිය වැව

c) කලා වැව

iii. රජරට ශිෂ්ටාචාර සමයට අයත් වාස්තු විද්‍යා නිර්මාණ බෙදෙන ප්‍රධාන කොටස් දෙක දක්වා ඒ පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

03)

i. මහනුවර රජධානියේ ආරම්භක පාලකයා ලෙස සැළකෙන්නේ කවරෙක්ද? (ල 2)

ii. මහනුවර රජධානියේ රජකළ නායක්කර් වංශික පාලකයින් හතරදෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ල 4)

iii. මහනුවර රාජධානියේ ආර්ථික රටාව පිළිබඳව පහත සඳහන් වන අංශ පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

a) කෘෂිකර්මාන්තය

b) වෙළඳාම

04)

i. යුරෝපයේ පුනරුදය ලෙසින් හඳුන්වන්නේ කුමක්ද? (ල 2)

ii. පුනරුදයේ ආරම්භය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු 4ක් සඳහන් කරන්න. (ල 4)

iii. පුනරුද සමයේ නිර්මාණය වූ පහත සඳහන් කලා ශිල්ප නිර්මාණය කරන ලද කලාකරුවන් සඳහන් කොට පුනරුද සමයේ කලාශිල්ප පිළිබඳව වැදගත්වන කරුණු 3 සඳහන් කරන්න.

a) අන්තිම රාත්‍රී භෝජනය

b) පියෙටා ප්‍රතිමාව

(ල 5)

05)

i. මහනුවර රාජධානියෙන් පෘතුග්‍රීසීන් පළවා හැරීමට ලන්දේසීන් සමඟ ගිවිසුමක් ඇති කරගත් මහනුවර රාජධානියේ පාලකයා කවරෙක්ද? (ල 3)

ii. උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට පැමිණි පෘතුගීසි සෙනෙවියන් තිදෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ල 3)

iii. මහනුවර යුගයේ චිත්‍ර දක්නට ලැබෙන ස්ථාන දෙකක් සඳහන් කර එම චිත්‍රවල දක්නට ලැබෙන ලක්ෂණ විස්තර කරන්න. (ල 5)